# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2017 ජූනි මස 06 වන අඟහරුවාදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**
**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.34 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණි | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු ගුණසිරි ජයනාත් | ( ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරාධ විමලරත්න
අනුරුද්ධ ලේකම්ගේ
අශෝක දයාරත්න
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඇන්ටනී උපුල් රාජිත
ඉන්දික බණ්ඩාර
ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදාර රත්නායක
උදේන විජේරත්න
උපාලි කොඩිකාර
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.එම්. සකාවුල්ලා
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
චන්දන ජයකොඩි
ජගත් කුමාර
ජයන්ත ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තුවාන් ආමිත් මොහමඩ් අක්රම්
නව්සර් ෆව්සි
නිමල් ආර්. පීරිස්
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂන් පාදුක්ක
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
ප්‍රදීප් පෙරේරා
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මහේෂ් අල්මේදා
මංජුල ප්‍රසන්න සම්පත්
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
මොරිස් විජේරත්න
මොහොමඩ් ෆයිරූස්
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
රන්දීර් රොද්‍රිගෝ
රවීන්ද්‍ර යසස් කුමානායක
රොජර් සෙනෙවිරත්න
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
රොයිස් විජිත
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලයනල් ජයසිංහ
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
විජිත් ප්‍රියන්ත
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සරත් පතිරණ
සහන් ප්‍රදීප්
සිරිකමල් පිලීෂියන් ද සිල්වා
සුනිල් වටගල
සුමිත් විජයමුණි ද සොයිසා
සුසිල් කිඳෙල්පිටිය
ශ්‍රීනාත් පෙරේරා
හරිස්චන්ද්‍ර කොස්තා
හෙක්ටර් බෙත්මගේ

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

අසෝක රන්වල
අමල් සිල්වා
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය
එස්. කුහවරදන්
කාමල් කුරුප්පු
කුරුසාමි කලන්කාඩි තේවර්
කේ.ඩී. අරුණ දීපාල්
කොලන්නගේ වජිර පෙරේරා
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
ජගත් අංගගේ
ජගත් පී. විතාන
ජනක දීපාල් වැලිවත්ත
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
තෙබුවන පියනන්ද හිමි
නිමල් චන්ද්‍රරත්න
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මහින්ද ජයසිංහ
රජිත හපුආරච්චිගේ
රවී විජේසේකර
සලෝචන ගමගේ
සුසාර දිනාල්
සෙනල් වෙල්ගම
සේනක දමයන්ත ද සිල්වා
ශිරන්ත අමරසේකර

***ගංවතුරින් විපතට පත් වූවන් වෙනුවෙන් ඔවුන්ගේ පවුලේ අයටත්, අවතැන් වූ අයටත්, විපතට පත් වූ අයටත් ගරු සභාපතිතුමාගේ ඉල්ලීම පරිදි පළාත් සභාව විනාඩි දෙකක නිශ්ශබ්දතාවයකින් සිය ශෝකය පළ කරන ලදී.***

## 01. කාරක සභා වාර්තා :

ගරු සභාපතිතුමා විසින් පහත සඳහන් කාරක සභා වාර්තා පිළිගන්වන ලදී.

i. 2017.04.26 වන දින පැවති මහජන පෙත්සම් කාරක සභා වාර්තාව සහ
ii. 2017.05.23 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව

***පූ.භා. 11.11 ට, ගරු සභාපති [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපති [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

***පූ.භා. 11.41 ට, ගරු නියෝජ්‍ය සභාපති [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපති [සුනිල් විජේරත්න මහතා]මූලාසනාරූඪ විය.***

## 02. කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයෙහි වාහන ගාල් කර තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා :

*"කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයෙහි වාහන ගාල් කර තැබීමේ අතුරු ව්‍යවස්ථා නම් වූ අතුරු ව්‍යවස්ථා"[1] සම්මත කිරීම සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන් ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමා විසින් පළාත් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.*

## 03. රීති අංක 107 යටතේ යෝජනාව :

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"පොදු වැදගත්කමකින් යුක්ත වූද, පහත සඳහන් වන යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට ආනුෂාංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(2), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි යෝජනා කරමි."*

## 04. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : [ගණපූරණය නොමැතිව කල් ගියේය.]

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"බස්නාහිර පළාතේ සහ අනෙකුත් පළාත්වල පසුගිය දිනවල ඇද හැළුණු වර්ෂා පතනය නිසා ඇති වූ ගංවතුරෙන් සහ නායයෑම් වලින් මියගිය හා අවතැන් වූ ජනතාවට බස්නාහිර පළාත් සභාව තම කනගාටුව පළ කර සිටින්නීය."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

**අනතුරුව, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා විසින් පහත සංශෝධනය ඉදිරිපත් කරන ලදී.**

*"පසුගිය දින කීපය තුළ ඇති වූ නායයෑම හා ජල ගැලීම් තුළින් බස්නාහිර පළාත තුළ පමණක් පවුල් 55,962 ක්ද, පුද්ගලයන් වශයෙන් ගත් කළ 212,971 ක් ආපදාවට ලක් වූ අතර අතුරුදහන් 50 ක් හා මියගිය 65 ක් වන අතර අතුරුදහන් හා මියගිය අය වෙනුවෙන් සාධාරණ වන්දි මුදලක්ද සම්පූර්ණයෙන් ජලයෙන් යට වූ නිවාස සඳහා මූලික අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට රුපියල් 50,000/- ක මුදලක් ද කඩිනමින් පළාත් සභාවෙන් ලබා දෙන ලෙස පළාත් සභාව යෝජනා කර සිටින්නේය."*

*සංශෝධිත යෝජනාව සභාභිමුඛ කරන ලදී.*

[1] 2017.06.06 වන දින නිල වාර්තාවේ පළ කර ඇත.

***අ.භා. 12.17 ට, ගරු සභාපති [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපති [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

*අ.භා. 02.11 ට ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා විසින් ගණපූරණය පිළිබඳ ප්‍රශ්නය නගන ලදුව, එවලේ සභාවේ ගණපූරණය නොමැති බව පෙනී ගියෙන්, කැඳවීම් සීනුව නාද කිරීමට නියෝග කරන ලදී.*
*පසුවද, ගණපූරණය ඇති නොවූ බැවින් යෝජක ගරු මන්ත්‍රීතුමාගේ ඉල්ලීමට අනුව ;*

## 05. 12(1) රීතිය යටතේ කල් තැබීම :

එකී යෝජනාවේ ඉදිරි කටයුතු ඊළඟ සභාවට යොමු කරමින් ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 02.17 ට, 2017 ජූනි මස 20 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2017.06.07
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.
කුමා/07